රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி / Telephone: **(94) 011- 2694560**
ෆැක්ස් / தொலைநகல் / Fax: **(94) 011- 2692254**
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: **dgcs@pubad.gov.lk**
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: **www.pubad.gov.lk**

---

මගේ අංකය / எனது இல / My No: CS/DOS/Policy/01/02

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2024.03.01

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>ඒකාබද්ධ සේවයේ නිලධරයන්ගේ පත්වීම ස්ථිර කිරීම නිර්දේශ කිරීම සහ අදාළ ලේඛන යොමු කිරීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ අංක PA/CS/POLICY/Guidelines හා 2020.08.24 දිනැති ලිපියට වැඩිමනත් වශයෙනි.

02. ඒ අනුව 2020.01.01 දිනට පසුව ඒකාබද්ධ සේවයේ සංවර්ධන නිලධාරී තනතුරකට පත්ව ඔබ අමාත්‍යාංශයට/ දෙපාර්තමේන්තුවට/ කාර්යාලයට අනුයුක්තව සේවය කරනු ලබන නිලධාරීන්ගේ පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ සහ ලිපිලේඛන ඉදිරිපත් කිරීමේදී PA/CS/POLICY/Guidelines හා 2020.08.24 දිනැති ලිපිය මඟින් ප්‍රකාශයට පත් කර ඇති උපදෙස් මාලාව අනුව කටයුතු කළ යුතුය. එහිදී CSC - I ආකෘති පත්‍රය සහ අදාල ලිපිලේඛන නිලධරයාගේ පත්වීම් දින සිට මාස 06ක් ඇතුළත එවිය යුතු වන අතර CSC – II ආකෘති පත්‍රය සහ අදාල ලිපිලේඛන නිලධරයාගේ පරිවාස කාලය/ වැඩබැලීමේ කාලය අවසන් වූ වහාම ඉදිරිපත් කළ යුතුය.

03. රට තුළ පැවති කොවිඩ් 19 වසංගත තත්වය සහ රජයේ වියදම් සීමා කිරීම්, ලිපි ද්‍රව්‍යවල පවතින හිඟතාවය වැනි කරුණු හේතුවෙන් 2020, 2021 හා 2022 වසරවලදී සංවර්ධන නිලධාරී සේවයට බඳවාගනු ලැබූ නිලධාරීන්ගේ පත්වීම් දින සිට මාස 06ක් තුල එවිය යුතු CSC - I ආකෘති පත්‍රය සහ අදාල ලිපිලේඛන වැඩි සංඛ්‍යාවක් මේ වන විටත් ලැබී නොමැති අතර ඇතැම් නිලධාරීන්ගේ පත්වීම ස්ථිර කිරීමට නියමිත සුදුසුකම් සපුරා ඇති බැවින්, පත්වීම ස්ථිර කිරීමේදී සිදුවිය හැකි ප්‍රමාදයන් වැළැක්වීම පිණිස මෙතෙක් CSC - I ආකෘති පත්‍රය සහ අදාල ලිපිලේඛන ඉදිරිපත් කර නොමැති නිලධාරීන්ගේ පත්වීම ස්ථිර කිරීමට නිර්දේශ (CSC – II ආකෘති පත්‍රය මඟින්) ඉදිරිපත් කිරීමේදීම CSC – I ආකෘති පත්‍රය සහ අදාල ලිපිලේඛන ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ.

04. එමනිසා මෙම නිලධාරීන්ගේ පත්වීම් දින සිට මාස 06ක් ඇතුළත එවිය යුතු CSC – I ආකෘති පත්‍රය සහ අදාල ලිපිලේඛන මෙතෙක් ඉදිරිපත් කර නොමැති නම්, එම ආකෘති පත්‍රය සහ අදාල ලිපිලේඛනද CSC – II ආකෘති පත්‍රය සහ අදාල ලිපිලේඛන ඉදිරිපත් කරන අවස්ථාවේදීම මා වෙත එවීමට කටයුතු කරන ලෙසත්, දැනටමත් CSC - I ආකෘති පත්‍රය සහ අදාල ලිපිලේඛන එවා ඇත්නම් නිලධරයාගේ පරිවාස කාලය අවසන් වූ වහාම පත්වීම ස්ථිර කිරීමට ලිපිලේඛන එවීමේදී CSC – II ආකෘති පත්‍රය සහ අදාල ලිපිලේඛන පමණක් එවීමට කටයුතු කළ යුතු බවත් කාරුණිකව දන්වා සිටිමි.

05. තවද 2020.01.01 දිනෙන් පසුව සංවර්ධන නිලධාරී සේවයේ ස්ථිර පත්වීම් ලද නිලධාරීන්ට වැටුප් ගෙවීම, පරිවාස වාර්තා සැපයීම හා අනෙකුත් ආයතනික කටයුතු සිදු කිරීම සම්බන්ධව අමාත්‍යාංශ ලේකම්වරුන්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීම සඳහා නිකුත් කරන ලද පහත ලිපි මඟින් ලබා දී ඇති උපදෙස් කෙරෙහිද ඔබගේ අවධානය යොමු කරවන බව වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

i. 2020.01.01 දිනැතිව ස්ථිර පත්වීම් ලද නිලධාරීන් සඳහා නිකුත් කරන ලද මගේ අංක CS/DOS/Policy/01/02 හා 2020.10.20 දිනැති ලිපිය

ii. 2021.01.01 දිනැතිව ස්ථිර පත්වීම් ලද නිලධාරීන් සඳහා නිකුත් කරන ලද මගේ අංක CS/DOS/Policy/01/01(II) හා 2023.05.19 දිනැති ලිපිය

iii. 2022 වර්ෂයේ ස්ථිර පත්වීම් ලද නිලධාරීන් සඳහා නිකුත් කරන ලද මගේ අංක CS/DOS/Policy/16 හා 2023.05.19 දිනැති ලිපිය

එස්.ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්